# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 12,840 — 1961 දෙසැම්බර් 30 වැනි සෙනසුරාද — 30.12.1961**

**(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

එල්. ඩී. බී.—80/44.

### පඩි පාලක සභා ආඥපනත් නිවේදනය

පඩි පාලක සභා ආඥපනතේ (136 පරිච්ඡේදය) 20 (2) (ඩී) යන වගන්තිය යටතේ ඇමතිවරයා විසින් වර්ෂ 1944 නොවැම්බර් 3 දින අංක 9,327, වර්ෂ 1946 අගෝස්තු 16 දින අංක 9,591, වර්ෂ 1947 මාර්තු 21 දින අංක 9,683, වර්ෂ 1948 දෙසැම්බර් 10 දින අංක 9,928, වර්ෂ 1949 අප්‍රේල් 1 දින අංක 9,963, වර්ෂ 1950 ජූනි 2 දින අංක 10,108, වර්ෂ 1953 ජූනි 25 දින අංක 10,541, වර්ෂ 1958 ඔක්තෝබර් 27 දින අංක 11,568, වර්ෂ 1961 ජූලි 7 දින අංක 12,508 යන ගැසට් පත්‍රයන්හි පළ කරණ ලද නිවේදන මාර්ගයෙන් නියම බලධාරියා ලෙස පත් කරනු ලැබූ ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ තැන්පත් ඇලන් බැසිල් සැමුවෙල් නේසරාජා පුල්ලෙනායගම් වන මම, මෙහි දක්වෙන උපලේඛනයෙහි සඳහන් එක් එක් ව්‍යාපාරයෙහි නියුක්ත සේවකයින් කෙරෙහි, වර්ෂ 1961 දෙසැම්බර් මස තුළ අදාල කළහැකි ජීවන වියදම් දර්ශණාංකය 106·2 වන බව මෙයින් ප්‍රකාශ කරමි.

ඒ. බී. ඇස්. ඇන්. පුල්ලෙනායගම්,
වැඩබලන ජනලේඛන හා සංඛ්‍යාලේඛන අධ්‍යක්ෂ.

1961 දෙසැම්බර් මස 27 දින,
කොළඹ, තැ. පෙ. 563 දරණ,
ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුවේදී ය.

### උපලේඛනය

1. ඉන්ජිනේරු ව්‍යාපාරය.
2. මුද්‍රණ ව්‍යාපාරය.
3. තේ පිටරට යැවීමේ ව්‍යාපාරය.
4. රබර් පිටරට යැවීමේ ව්‍යාපාරය.
5. මෝටර් රථ ගමනාගමන ව්‍යාපාරය.
6. ගිනිපෙට්ටි සෑදීමේ ව්‍යාපාරය.
7. සිනමා (චිත්‍රපටි) ව්‍යාපාරය.
8. නෞකාගාර නැව්තොට හා වරාය ගමනාගමන ව්‍යාපාරය.
9. ගොඩනැගිලි ව්‍යාපාරය.
10. තේ වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය.
11. කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය.
12. රබර් වැවීමේ සහ සෑදීමේ ව්‍යාපාරය.
13. පොල් වැවීමේ ව්‍යාපාරය.
14. පොල් සෑදීමේ ව්‍යාපාරය.
15. මිනිරන් ව්‍යාපාරය.
16. බේකරි ව්‍යාපාරය.
17. ගඩොල් හා උළු සෑදීමේ ව්‍යාපාරය.

12—99/1

2379—ජේ. ඇන්. ආර් 629—5,500 (12/61)

## තේ වැවීම සහ සැදීම, කොකෝවා, කරදමුංගු හා ගම්මිරිස් වැවීම හා සැදීම, පොල් වැවීම, පොල් සැදීම, මිණිරන්, ඉංජිනේරු, මුද්‍රණ, මෝටර් රථ ගමනාගමන, තේ පිටරට යැවීම, රබර් පිටරට යැවීම, ගිනි පෙට්ටි සෑදීම, චිත්‍රපට (සිනමා), නෞකාගාර නැව් තොට හා වරායයන්හි ගමනාගමනය, ගොඩනැගිලි, බේකරි සහ ගඩොල් සහ උළු සෑදීම යන කර්මාන්තයන්හි නියුක්ත වැඩකරුවන්හට ගෙවිය යුතු විශෙෂ දීමනා

ඉහත සඳහන් කර්මාන්ත සඳහා, 1961 දෙසැම්බර් මාසයේ ජීවන වියදම් අංකය 106·2 වන නිසා, ඒ ඒ අවස්ථාවේ හැටියට, 1962 ජනවාරි මාසය වෙනුවෙන් හෝ 1962 ජනවාරි මාසයේ සාමාන්‍ය වැඩ කරන දිනයන් වෙනුවෙන් හෝ ගෙවිය යුතු විශෙෂ දීමනාව, පහත දැක්වෙන ආකාරයට බැව්, පඩි පාලක සභා ආඥාපනතේ, 20(2) (ඇ) යන වගන්තිය යටතේ, මෙයින් දන්වනු ලැබේ :—

1. තේ වැවීම හා සැදීම, රබර් වැවීම හා සැදීම, කොකෝවා, කරදමුංගු සහ ගම්මිරිස් වැවීම හා සැදීම යන කර්මාන්ත :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශෙෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 16කට අඩු නැති පිරිමි වැඩකරුවකුට | 1 18 |
| වයස අවුරුදු 15කට අඩු නැති ගැහැණු වැඩකාරියකට | 0 88 |
| ළමා වැඩකරුවකුට | 0 81 |

2. පොල් වැවීමේ කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශෙෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 16 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට (කංකානම ද ඇතුළුව) | 1 18 |
| වයස අවුරුදු 15 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට | 0 88 |
| වයස අවුරුදු 16 කට අඩු පිරිමි වැඩකරුවකුට හෝ වයස අවුරුදු 15 කට අඩු ගැහැණු වැඩකාරියකට | 0 81 |

3. පොල් සැදීමේ කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශෙෂ දීමනාව රු. ශ. |
|---|---|
| වයස අවුරුදු 18 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට (කංකානම ද ඇතුළුව) | 2 03 |
| වයස අවුරුදු 18 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට | 1 68 |
| වයස අවුරුදු 18 කට අඩු (ස්ත්‍රී පුරුෂ භේදය නොසළකා) වැඩකරුවකුට | 1 61 |

4. මිණිරන් කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශෙෂ දීමනාව රු. ශ. |
|---|---|
| විකිණිය හැකි මිණිරන් ශුද්ධ කිරීම හා සකස් කිරීම පිළිබඳ වැඩවල යෙදී සිටින අය නොවන වැඩකරුවෝ— | |
| වයස අවුරුදු 18 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට | 1 27 |
| වයස අවුරුදු 18 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට | 0 94 |
| වයස අවුරුදු 18 කට අඩු (ස්ත්‍රී පුරුෂ භේදයක් නොසළකා) වැඩකරුවකුට | 0 87 |
| විකිණිය හැකි මිණිරන් ශුද්ධ කිරීම හා සකස් කිරීම පිළිබඳ වැඩවල යෙදී සිටින වැඩකරුවෝ— | |
| වයස අවුරුදු 18 කට අඩු නැති පිරිමි වැඩකරුවකුට | 1 47 |
| වයස අවුරුදු 18 කට අඩු නැති ගැහැණු වැඩකාරියකට | 1 14 |
| වයස අවුරුදු 18 කට අඩු (ස්ත්‍රී පුරුෂ භේදයක් නොසළකා) වැඩකරුවකුට | 1 07 |

5. ඉංජිනේරු කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | සාමාන්‍ය වැඩ කරන දිනයකට ලැබිය යුතු විශෙෂ දීමනාව රු. ශ. |
|---|---|
| අදක්ෂ/නුපුහුණු කම්කරුවෝ | 2 09 |
| අර්ධ වශයෙන් පුහුණු කම්කරුවෝ, 1 වන සහ 2 වන වර්ගය, පුහුණු කම්කරුවෝ, කංකානීහු හා මුර කරුවෝ | 2 19 |
| කර්මාන්ත ඉගෙන ගන්නෝ හා වැඩ පුරුදු වන්නෝ— | |
| 1 වන අවුරුද්ද | 1 13 |
| 2 වන අවුරුද්ද | 1 23 |
| 3 වන අවුරුද්ද | 1 54 |
| 4 වන අවුරුද්ද | 1 69 |

6. මුද්‍රණ කර්මාන්තය :

| වැඩකරුවාගේ පන්තිය | මාසයට ලැබිය යුතු විශෙෂ දීමනාව රු. ශ. |
|---|---|
| වැඩ ඉගෙන ගන්නන් හා වැඩ පුරුදුවන්නන් නොවන වැඩකරුවෝ— | |
| 'ඒ' පන්තිය | 102 42 |
| 'බී' පන්තිය | 82 42 |
| 'සී' පන්තියේ I වන වර්ගය | 72 42 |
| 'සී' පන්තියේ II වන වර්ගය | 67 32 |
| 'ඩී' පන්තිය | 62 42 |
| 'ඊ' පන්තිය | 59 97 |
| 'එෆ්' පන්තිය | 40 42 |
| 'ජී' පන්තිය | 62 42 |

| වැඩ ඉගෙන ගන්නෝ හා වැඩ පුරුදු වන්නෝ— | 1 වැනි අවුරුද්ද රු. ශ. | 2 වැනි අවුරුද්ද රු. ශ. | 3 වැනි අවුරුද්ද රු. ශ. | 4 වැනි අවුරුද්ද රු. ශ. | 5 වැනි අවුරුද්ද රු. ශ. |
|---|---|---|---|---|---|
| 'ඒ' පන්තිය | 43 92 | 52 42 | 60 92 | 73 42 | 86 42 |
| 'බී' පන්තිය | 37 92 | 50 42 | 56 92 | 66 32 | — |
| 'සී' පන්තියේ I වන වර්ගය | 39 92 | 45 32 | 50 92 | 58 97 | — |
| 'සී' පන්තියේ II වන වර්ගය | 37 92 | 42 87 | 47 82 | 55 09 | — |
| 'ඩී' පන්තිය | 35 92 | 40 42 | 44 92 | 51 42 | — |